

සිතේ මළකඩ නසන සොඳුරු මඩකඩ අරණ

## ჯ සමගිය – සැපත වැඩෙන උදාර පින්කම

– බෙංගමුවේ නාලක හිමි

ඉල්පුර පසළොස්වක පෝද ධර්ම දේශනාවෙන් කඨින පින්කමේ යහපත් ප්‍රතිඵල පිළිබඳ විමසුමක්. මහත් ඵල ගෙන දෙන පින්කමක් වශයෙන් පමණක් නොව සමගිය හා සාමය වැඩෙන සාමාජික කට–යුත්තක් හැටියටද කඨින පින්කමෙහි වැදගත්කම.

## ჯ දස පාරමිතාවෙන් 'නිවන' ලැබෙන හැටි

– දුමින්ද කරුණාතිලක

බෞද්ධ විමුක්ති පිළිවෙත පිළිබඳ ප්‍රකට විවිධ බුද්ධ දේශනා අතර සඳහන් වන 'දස පාරමිතා පිළිවෙත' නිවන් සැපත ලබාගැනීමට උප–යෝගි වන ආකාරය. දස පෙරුම් දම් පිරීමේදී පුද්ගල මනස තුළ වෙනස්කම් සිදුවන ආකරය විග්‍රහ කිරීමෙන් එමගින් සංසාර විමුක්–තිය ප්‍රායෝගික වන ආකාරය පහද දීමට ලේඛකයා උත්සාහ දරයි.

## ჯ සිරිලක ප්‍රථම දාගැබ ලෙස සැලකෙන ථූපාරාමය

සුප්‍රකට බෞද්ධ පූජා නගරයක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි 'අට–මස්ථාන' නම් වූ ප්‍රසිද්ධ සිද්ධස්ථාන අතරින් එකක් වූ ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් ඉදිවූ බෞද්ධ චෛත්‍යය වශයෙන් සැලකෙන ථූපාරාම චෛත්‍යය පිළිබඳ ඓතිහාසික තොරතුරු.

## ჯ ධර්ම දූත සේවාව සහ බුද්ධ ධර්මයේ ව්‍යාප්තිය

–මුරුංගාගස්යායේ ඤාණිස්සර හිමි

ඉල් පුර පසළොස්වක පෝ දිනක බුදුරදුන් විසින්ම අරඹන ලද ධර්ම ප්‍රචාරක සේවාවේ ඉතිහාසගත තොරතුරු එද – මෙදතුර ලෝක සමාජය තුළ බුදුදහමේ ව්‍යාප්තිය සිදුවූ ආකාරය.

## ჯ අරුත දැන කළ යුතු අති උතුම් බුදු පුද

– බී. ඒ. විමලසේන

බුදුරදුන්ට පුද පූජා පැවැත්වීම – එහි අරුත හොඳින් දැන සිදුකළ යුත්තක් බවත්, බුද්ධත්වය පිළිබඳ – දහම පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව – හුදෙක් ලාභාපේක්ෂාවෙන් සිදු කැරෙන පුද පූජා, සැබෑ බුද්ධ පූජා හැටියට සැලකිය නොහැකි බවත්, මෙම ලිපියෙන් පැහැදිලි කිරීමට ලේඛකයා උත්සාහ කරයි.

## ჯ සිතේ මළකඩ නසන සොඳුරු මඩකඩ අරණ

–හරිස්චන්ද්‍ර කහවල

ඉංගිරිය – පාදුක්ක මාර්ගයේ (ඉංගිරියේ සිට) කිලෝමීටරයක් පමණ ගමන් කරන විට හමුවන මහ ඉංගිරිය ග්‍රාමයෙන් දකුණට හැරී තවත් කිලෝමීටර් 1 1/4 ක් පමණ ගිය තැන හමු වන මඩකඩ මූකලාන වනාන්තරය මැද පිහිටි සොඳුරු සෙනසුනක් පිළිබඳ විස්තරයකි.

## ჯ මග ඵල ලැබීම සිහිනයක් නොවේ – 5

– දෙලොස්වල උදිතධීර හිමි

බුදු දහමෙහි සඳහන් විමුක්ති පිළිවෙතට අදළ උසස් මානසික මට්–ටම් ලැබීම බොහෝ දෙනා සිතන තරම් දුෂ්කර දෙයක් නොවන බවත්, ඒ සඳහා පිළිපැදිය යුතු විදර්ශන භාවනාවත් පහද දීමට දරන උත්සාහයකි.

## ჯ අකුසලය වළක්වන උපක්‍රම පහක්

–කිරිබත්ගොඩ ඤානානන්ද හිමි

සිතේ පහළ වන රාග – ද්වේෂ – මෝහ ආදී අකුසල (අදක්ෂ) ස්වභාව දුරුකර – සිත පිරිසුදු කොට නිවන් මගට යොමුකිරීම සඳහා බුදු–රදුන් විසින් පෙන්වා දෙනු ලැබූ උපක්‍රම පහක් පිළිබඳ විමර්ශනයකි.

## ෴ මිහිතලය සැපදායක කරමු

–මඩකුඹුරුමුල්ලේ සෝම එච්. පතිරණ
දහම්සොඬ රජුගේ ජීවන චරිතයේ කැපී පෙනුණු ලක්ෂණ හෙළිදරව් කර එය අප ජීවිතවලට යාකර ගත හැකි අයුරු කියාපාන ලිපියකි. රසවත් කතාවකි.

## ෴ හැඬුමෙන් – ගැයුමෙන් – පිදුමෙන් නොලැබෙන බුදු-සරණ

–වතුරුගම නන්දසිරි හිමි
බුදුරදුන් සරණ යෑම – හුදෙක් පුද පූජා හා යාච්ඤා මත පමණක් පදනම් වී ඇති දෙයක් නොවන බවත්, බුදු ගුණයෙන් බිඳක් තමන් තුළ ඇති කරගැනීමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයකින් හැරෙන්නට බුදුසරණ ලබාගැනීමට කිසිවකුටත් නොහැකි බවත්, මෙම ලිපියෙන් පැහැදිලි කැරේ.

## ෴ වස්සානයේ ඉතිහාසය හා කඨින චීවර පින්කම

–කුඩාගල කෝවිද හිමි
වස් විසීම පිළිබඳ පැරැණි බෞද්ධ සම්ප්‍රදායයෙහි ඉතිහාසය හා කඨින චීවර පූජාව සිදුවිය යුතු ආකාරය පිළිබඳ විමසීමකි.

## ෴ බෞද්ධ මනෝ විද්‍යාව

–පිටිදූවේ සිරිධම්ම හිමි
සිතට පිරිපුන් සුවය දෙන සිත දකින බොදු ඇස
සිතේ ලෙඩ සුවකිරීම සඳහා බෞද්ධ මනෝ විද්‍යාව මගින් ඉටුකළ හැකි මෙහෙය. සියලු මානසික රෝග හා දුබලතා පිටුදැක පිරිපුන් මානසික මට්ටමකට මිනිස් සිත පත්කිරීමට ඊට ඇති හැකියාව.

## ෴ මුගලන් මහරහතන් වහන්සේ

–මාදම්පේ සරණතිස්ස නාහිමි
ගෞතම බුදුරදුන්ගේ ප්‍රධාන ශ්‍රාවක හිමිවරුන් දෙදෙනාගෙන් එක් අයකු වන මුගලන් මහරහතන් වහන්සේ පිළිබඳ ලිපියකි. ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ දක්ෂතා (අධිමානසික හැකියා) අතින් බුදුරදුන්ට පමණක් දෙවැනි වන තරමේ ඉහළ මට්ටමක සිටි මුගලන් හිමියන්ගෙන් බෞද්ධ සමාජයට ලබාගත හැකි ආදර්ශ හෙළිදරව් කරගැනීමට දරණ ප්‍රයත්නයක් වශයෙන් මේ ලිපිය හැඳින්විය හැකිය.

## ෴ The model and standard chief disciples of the Buddha